# මහජන දැන්වීම

## මහජන අදහස් සහ යෝජනා කැඳවීමයි

### 1961 අංක 31 දරන ආයුර්වේද පනත සහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව සඳහා වන ආයුර්වේද සංග්‍රහය 2024 සංශෝධනය කිරීම

1961 අංක 31 දරන ආයුර්වේද පනත (2023 අංක 19 දරන පනතින් අවසන් වරට සංශෝධිත) හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව සඳහා වන ආයුර්වේද සංග්‍රහය 2024 (ආයුර්වේද සංග්‍රහය) කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම සහ පවතින ගැටලු නිරාකරණය කිරීමේ අරමුණින් එකී පනත සහ රෙගුලාසි සංශෝධනය කිරීමට ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් විශේෂ කමිටුවක් පත් කර ඇත.

මේ වන විටත් ආයුර්වේද සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇති අතර, ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂිතය.

ඒ අනුව, යම් ආයුර්වේද නිෂ්පාදනයක්, ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් සම්බන්ධයෙන් නිෂ්පාදනය කිරීම සහ සැකසීම, ආනයනය සහ අපනයනය, මිලදී ගැනීම සහ විකිණීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම, ප්‍රවාහනය සහ සැපයීම, ප්‍රචාරණය කිරීම සහ තත්ත්ව පාලනය (Quality Control) යනාදී කාර්යයන් වඩාත් විධිමත්ව නියාමනය කිරීම උදෙසා අදාළ පාර්ශ්වයන්ගේ සහ මහජනතාවගේ නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ලබා දෙන ලෙස කාරුණිකව දන්වා සිටිමු.

ඔබගේ අදහස් සහ යෝජනා බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ආයුර්වේද පනත හා ආයුර්වේද සංග්‍රහය සංශෝධනයට අදාළව මහජන අදහස් සහ යෝජනා කැඳවීම" යනුවෙන් සඳහන් කර 2026 ජූලි 16 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් විද්‍යුත් තැපැලට හෝ පහත දක්වා ඇති ලිපිනයට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු. තවද, 2026 ජූලි 16 වන දිනට පසු ඉදිරිපත් වන යෝජනා හා අදහස් භාරගැනීමට නොහැකි බව කාරුණිකව දන්වමු.

ලිපිනය : ලේකම් (නීති නිලධාරී),
1961 අංක 31 දරන ආයුර්වේද පනත හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා
ශල්‍ය වෛද්‍ය විද්‍යාව සඳහා වන ආයුර්වේද සංග්‍රහය
2024 සංශෝධනය කිරීම සඳහා වන කමිටුව,
දේශීය වෛද්‍ය අංශය, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

විද්‍යුත් තැපැල : dirtec.mim@health.gov.lk

**සභාපති,**
**1961 අංක 31 දරන ආයුර්වේද පනත හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා**
**ශල්‍ය වෛද්‍ය විද්‍යාව සඳහා වන ආයුර්වේද සංග්‍රහය 2024**
**සංශෝධනය කිරීම සඳහා වන කමිටුව.**

**ආයුර්වේද දෙපාර්තමේන්තුව,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.**

**දිනය : 2026.06.17**